''පුමිතිරි'' - ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ විද්‍යුත් සඟරාව
**Online ISSN: 3051-4924**
**https://journals.sjp.ac.lk/index.php/pumithiri**
**වෙළුම: 1; II කලාපය; 2024 නොවැම්බර්; පිටු: 3-8**

# සීගිරි කවියෙන් නිරූපිත කාන්තාවගේ සමාජීය භූමිකා

**හංසමාලා රිටිගහපොළ**
සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
hansamala@sjp.ac.lk

**සංක්ෂේපය**
සිංහල පද්‍ය සාහිත්‍යයේ ආරම්භය සටහන් වන්නේ ක්‍රි. පූ. 7 සිට 14 වැනි සියවස දක්වා කාලයට අයත් සේ සැලකෙන සීගිරි පද්‍යාවලියෙනි. සීගිරි කවි අතර වූ බහුතරයක් කවි ගී විරිතෙන් රචනා වී ඇති බැවින් සීගිරි ගී යනුවෙන් නාම ගැන්වී ඇත. සිංහල පද්‍ය සාහිත්‍ය ඉතිහාසයේ විද්‍යමාන පළමු කාව්‍යාවලිය වන්නේ සීගිරි ගී ය. කාලයාගේ ඇවෑමෙන් නටබුන් වූ සීගිරිය නරඹන්නට පැමිණි විවිධ සංචාරකයන් විසින් සීගිරි කැටපත් පවුරේ මේ ගී ලියන ලදැ'යි සැලකේ. සීගිරි ගී ලියූ සංචාරකයන් අතර රජවරු, පැවිද්දෝ, වෛද්‍යවරු, යුද සෙනෙවියෝ ආදිහු වෙති. ඒ අතරතුර ගී ලියූ කිවිඳියෝ ද වූහ. පුද්ගල නාමයෙන් තමා හඳුන්වා දෙමින් කවි ලියූ කාන්තාවෝ දහහතර දෙනෙක් සීගිරි නිර්මාණකරුවන් අතර වෙති. මේ කිවිඳියන්ගේත් කවි ලියූ අනෙක් අයගේත් නිර්මාණ බහුතරයකට පාදක වී ඇත්තේ සීගිරි පර්වතයේ චිත්‍රිත රූපාවලියයි. එහෙත් ඇතැම් ස්ත්‍රීහු සිය මනෝභාව, ස්වාධීන මතවාද පළ කිරීමටද අමතක නොකළහ. එකී කාව්‍ය නිර්මාණවලින් එවක කාන්තාවන්ගේ ජන ජීවිතය මෙන්ම ස්ත්‍රී චින්තන ස්වභාවයද අනාවරණය වී ඇත. එසේම කවි ලියූ වෙනත් අයගේ නිර්මාණවලින්ද සීගිරි සමාජයේ කාන්තාව පිළිබඳ තොරතුරු අනාවරණය කරගත හැකිය. එබැවින් සීගිරි සමාජයේ කාන්තාවගේ සමාජීය භූමිකාවේ ස්වරූපය, සීගිරි කවියෙන් නිරූපණය වී ඇත්තේ කෙසේද යන්න විමසා බැලීම මෙහි අභිමතාර්ථයයි. මෙහිදී සමාජවිද්‍යාවේ භාවිත වන සමාජීය භූමිකා සංකල්පය පදනම් කරගෙන මෙම විශ්ලේෂණය සිදුකෙරේ. ඒ අනුව සීගිරි සමාජයේ කාන්තාවන්ගේ සමාජීය භූමිකා හා බැඳුණු අභියෝගාත්මක ජන ජීවිතයත්, සම්ප්‍රදාය අබිමුව නොනැමුණු ස්වාධීනත්වයත් සීගිරි කවියෙන් ප්‍රකාශනය වී ඇති බව හඳුනාගත හැකිය.

**මුඛ්‍ය පද:** කාන්තාව, කිවිඳියෝ, භූමිකා අපේක්ෂාව, සමාජීය භූමිකා, සීගිරි ගී

## හැඳින්වීම

සිංහල පද්‍ය සාහිත්‍යයේ ආරම්භය සටහන් වන්නේ ක්‍රි. පූ. 7 සිට 14 වැනි සියවස දක්වා කාලයට අයත් සේ සැලකෙන සීගිරි පද්‍යාවලියෙනි (නාරද හිමි,2005:12). සීගිරි කවි අතර වූ බහුතරයක් කවි ගී විරිතෙන් රචනා වී ඇති බැවින් සීගිරි ගී යනුවෙන් නාම ගැන්වී ඇත. ක්‍රි. පූ. 3 වැනි සියවසට අයත් යැ'යි සැලකෙන අනුරාධපුර කොස්ගම කන්ද විහාර ලිපිය ඇතුළු තවත් ලිපි රැසක් යා ගී විරිතෙන් ලියා ඇති බව සෙනරත් පරණවිතානගේ අදහසයි. ඒවා විහාර ලෙන් පූජා කිරීමට ඡන්දසින් බැඳි වාර්තාය. ඒ කෙසේ වුවද සිංහල පද්‍ය සාහිත්‍ය ඉතිහාසයේ විද්‍යමාන පළමු කාව්‍යාවලිය වන්නේ සීගිරි ගීය. සීගිරි ගී රචනා වී ඇත්තේ ලංකාවේ විදග්ධ සම්ප්‍රදායේ කාව්‍ය චින්තනය සහ දෘෂ්ටිවාද බහුලව ව්‍යාප්ත වූ අවදියක බව පැවසේ (තිස්ස කුමාර, 2003:19). තවද සීගිරි කුරුටු ගී අයත්වන්නේ ක්‍රි. ව. 8, 9 සහ 10 වැනි සියවස්වලට බව සෙනරත් පරණවිතානගේ නිගමනයයි (ලොකුබණ්ඩාර, 2009: 7). පළමුවන කාශ්‍යප හෙවත් සීගිරි කාශ්‍යප (ක්‍රි. ව. 477-495) රජු විසින් ගොඩ නගන ලද සීගිරි රාජධානිය වසර 18කින් බිඳ වැටීමෙන් අනතුරුව ජනශුන්‍ය ස්ථානයක් බවටද, පොදු ජනතාවගේ නැරඹුම් මධ්‍යස්ථානයක් බවට ද පත්විය. එම වනගත රජ දහන නරඹන්නට පැමිණි විවිධ සංචාරකයන් විසින් සීගිරි කැටපත් පවුරේ මේ ගී ලියන ලදැ'යි සැලකේ. සීගිරි ගී ලියූ සංචාරකයන් අතර රජවරු, පැවිද්දෝ, වෛද්‍යවරු, යුද සෙනෙවියෝ ආදිහු වෙති. ඒ අතරතුර ගී ලියූ කිවිඳියෝද වූහ. පුද්ගල නාමයෙන් තමා හඳුන්වා දෙමින් කවි ලියූ කාන්තාවෝ දහහතර දෙනෙක් සීගිරි නිර්මාණකරුවන් අතර වෙති. ඔවුහු තමන්ගේ සැමියාගේ හෝ වෙනත් කිසියම් සබඳතාවක් අනුව සිය නාමය හඳුන්වා දුන්හ. නිදලු මිහිඳබු සෙවු, හුනගිරි වෙහෙර තෙරණිය, මහමත අම්බු දෙවා, උතුරා අබු සිව්කල, ජෙට් රජුන් කෙරෙවු කිතග්බො හිමි අම්බු තිසා හිමියම්බු, මහමෙත් හිමියා අබුනාල්

හිමියන්බුයු, සෙල අඹු ආදීන් ඊට නිදසුන්ය. එමෙන්ම බතී, දයල්, සෙන් බතී සහ සෙලු ආදී වශයෙන් තමන්ගේ නමින් හඳුන්වා දුන් කාන්තාවෝද වූහ. මේ කිවිඳියන්ගේ නිර්මාණ බහුතරයකට පාදක වී ඇත්තේ සීගිරි පර්වතයේ චිත්‍රිත රූපාවලියයි. එහෙත් ඇතැම් ස්ත්‍රීහු සිය මනෝභාවයන්, ස්වාධීන මතවාද පළ කිරීමටද අමතක නොකළහ. එකී කාව්‍ය නිර්මාණවලින් එවක කාන්තාවන්ගේ ජන ජීවිතය මෙන්ම ස්ත්‍රී චින්තන ස්වභාවයද අනාවරණය වී ඇත. එසේම කවි ලියූ වෙනත් අයගේ නිර්මාණවලින්ද සීගිරි සමාජයේ කාන්තාව පිළිබඳ තොරතුරු අනාවරණය කරගත හැකිය. එබැවින් සීගිරි සමාජයේ කාන්තාවගේ සමාජීය භූමිකාවේ ස්වරූපය, සීගිරි කවියෙන් නිරූපණය වී ඇත්තේ කෙසේද යන්න විමසා බැලීම මෙහි අභිමතාර්ථයයි. මෙහිදී සමාජවිද්‍යාවේ භාවිත වන සමාජීය භූමිකා න්‍යාය පදනම් කරගෙන මෙම විශ්ලේෂණය සිදු කෙරේ. ඒ අනුව සීගිරි සමාජයේ කාන්තාවන්ගේ සමාජීය භූමිකා හා බැඳුණු අභියෝගාත්මක ජන ජීවිතයත්, සම්ප්‍රදාය අබිමුව නොනැමුණු ස්වාධීනත්වයත් සීගිරි කවියෙන් ප්‍රකාශනය වී ඇති බව හඳුනාගත හැකිය.

**සාකච්ඡාව**

සීගිරි කුරුටු ලිපිවලින් වැඩි කොටසක් රචනා කර ඇත්තේ පද්‍යයෙනි. එහි ගී පබැඳුම් 685කි. සෙනරත් පරණවිතානට අනුව සීගිරි ගීවලින් සුළු ප්‍රමාණයක් හැර අනෙක් සියල්ලම චිත්‍රගත ලලනාවන් සඳහාම ලියන ලද ඒවා බව ඔහු එකී ගීවලට දෙන අර්ථකථනවලින් පැහැදිලි වන බව දො. ඩ. ඩයස්ගේ අදහසයි (ඩයස්,1994:සං). ඒ අනුව දො. ඩ. ඩයස් ඔහුගේ 'දිවමන් ළඳුනට ගැයූ සීගිරි ගී' යන කෘතියෙන් පළ කරනුයේ ඊට වෙනස් වූ අදහසකි. ඒ මෙසේය. 'අප මේ කුඩා පොතින් උත්සාහ දරන්නේ කවීන් තමන්ගේ කවි සංකල්පනාවට ආරම්මණ කොටගත්තේ චිත්‍රගත රූමතියන්ගේ ලාවණ්‍යය මතු නොව සීගිරිය නැරඹීමට පැමිණ සිටි සභාශීලී රූමතියන්ගේ විවිධ සමාජ සංසිද්ධිද ඒ කවි සංකල්පනාවට විෂය කොටගෙන ඇති ආකාරය විමංසනය කර බැලීමටය.' සීගිරිය පෙම්වතුන් පෙම්වතියන්, යහළු යෙහෙළියන්, අඹුසැමියන් පමණක් නොව නව සබඳතා පවත්වනු රිසියවුන්ද එක්ව තම තම තමන්ගේ විවිධ සිතැගි මුදුන්පත් කරගත් ජය බිමක් බඳු වූ බව ඔහුගේ අදහසය (ඩයස්,1994:සං-ංසසස). වි.ජ.මු. ලොකුබණ්ඩාර විසින් රචිත 'සීගිරි ගීසිරි' කෘතියෙන්ද සීගිරිය නැරඹීමට පැමිණි කාන්තාවන් කවියන්ට විෂය වූ බව දක්වා ඇත. 'සීගිරි කවීන් විසින් ලියන ලද ගීවලට විෂය වූයේ හුදෙක් සීගිරි කාන්තාවෝ පමණක් නොවෙති. එදා සීගිරි කඳු පියස්සේ පැවැත්වුණු ගිරග්ග සමජ්ජ වැනි උලෙළක් සඳහා හෝ සීගිරියේ සිරි නැරඹීම සඳහා හෝ පැමිණි ජනකාය අතර සිටි රූමත් ළඳුන් ගැනද ලියන ලද ගී රාශියකට කැටපත් පවුරේ ඉඩ ලැබෙයි. මේ පොතෙහි 'රන්වනුනට නො ලී ගී' යන ලිපියෙහි ඒ ගීවලින් සමහරක් අඩංගු වී ඇත' (ලොකුබණ්ඩාර,2009:25). ඒ අනුව පැහැදිලි වන්නේ සීගිරි ගී අතර සීගිරි සමාජය නියෝජනය කළ කාන්තාවන් ගැන ලියූ කවිද තිබූ බවයි. එබැවින් මෙම විමර්ශනය සිදු කෙරෙනුයේ උක්ත කෘති පාදක කරගනිමිනි.

සීගිරි සමාජයේ කාන්තාවගේ සමාජීය භූමිකාවේ ස්වරූපය හඳුනා ගැනීමේදී සමාජීය භූමිකා යනු කුමක්දැ'යි අර්ථකථනය කර ගැනීම වැදගත් වේ. සමාජීය භූමිකාවකට නැතහොත් කාර්ය කොටසකට ඇතුළත් වන්නේ කෙනෙකු විසින් හොබවනු ලබන, පවත්වාගෙන යනු ලබන තත්ත්වයකට අදාළ සමාජ සම්මත එමෙන්ම උගත් චර්යා රටාය. එබඳු කිසියම් තත්ත්වයක් නැතිනම් භූමිකාවක් නියෝජනය කරන අවස්ථාවලදී එකී තත්ත්ව, භූමිකාවලට අදාළව සමාජයෙන් නිර්දේශිත හැසිරීමෙහි නිරත විය යුතු වේ. භූමිකා අපේක්ෂාව (Role Expectancy) යනු කිසියම් තත්ත්වයක් නියෝජනය කරන අයෙකුගෙන් අභිප්‍රේත වූ නිශ්චිත හැසිරීමයි. ඕනෑම සමාජයක සාමාජිකයෙකු කිසියම් අවස්ථාවකදී යම් භූමිකා රංගනයකදී ඊට අදාළ පොදු ප්‍රතිමාන, ආරක්ෂා වන අයුරින් ක්‍රියා කරතැ'යි අපේක්ෂා කෙරේ. ඒ අනුව පැහැදිලි වන්නේ සංස්කෘතියට සාපේක්ෂව සමාජීය භූමිකා විශ්ලේෂණය වන බවයි (ජයසිංහ,2013:124-125). එසේම සමාජයේ ක්ෂුද්‍ර, සාර්ව හා අතරමැදි ස්තර අතර ඇති සම්බන්ධය අවබෝධ කරගැනීමේ එක් ප්‍රධාන අංගයක් ලෙසද මෙකී භූමිකා න්‍යාය ක්‍රියාත්මක වේ. කිසියම් පුද්ගලයකු නියෝජනය කරන තත්ත්වයේ ගතික අංගයක් ලෙසද භූමිකාව වැදගත් වේ. සමාජයේ සෑම තරාතිරමකටම අනුයුක්තව භූමිකාවක් පවතින අතර සෑම භූමිකාවකටම අනුයුක්තව කිසියම් තත්ත්වයක්ද පවතී. මෙම තත්ත්වය 1936 දී රැල්ෆ් ලින්ටන් අර්ථකථනය කළේ අයිතියක් සහ යුතුකම් එකතුවක් ලෙසිනි (Turner, 2006:233).

සීගිරි නිර්මාණකරුවන් අතර පුද්ගල නාමයෙන් තමා හඳුන්වා දෙමින් කවි ලියූ කාන්තාවෝ දහහතර දෙනෙක් වූහ. ඒ හැඳින්වීම්වලින් ඔවුන්ගේ සමාජ තත්ත්වයද අනාවරණය වී ඇත. හුනගිරි වෙහෙර තෙරණිය, ජෙට් රජුන් කෙරෙවු කිතග්බො හිමි අම්බු තිසා හිමියම්බු, මිහිදල ඇපාණන්ගේ පයමුල්ලෙය්දරු

බොහොදෙවියා එකී කාන්තාවන්ය. මෙහි තිසා නමැති කාන්තාව වූකලි කිතග්බො හිමිගේ භාර්යාවයි. ඇය ජෙට් නම් කුමාරිකාවගේ පරිවාර කාන්තාවකි (මුණසිංහ, 2011:89). තවද මිහිදල ඇපාණන්ගේ පයමුල්ලෙය්දරු බොහොදෙවියා යනුවෙන් කියැවෙන්නේ මිහිදල් ඇපාණන්ගේ පෞද්ගලික ලේකම්වරියක වූ කාන්තාවක් බව ප්‍රණීත් අභයසුන්දරගේ අදහසයි (අභයසුන්දර, 2001:34). එකී නාමගැන්වීම්වලින් පැහැදිලි වන්නේ එදා කාන්තාවන්ට හිමිව තිබූ සමාජ තත්ත්වයයි. පරණවිතාන පවසන පරිදි සීගිරි ගීයෙන් එවක පැවැති බින්න විවාහ පිළිබඳවද අනාවරණය වී ඇත. බින්න විවාහය යනු විවාහක බිරියගේ පවුලේ වෙනත් දරුවන් නොමැති අවස්ථාවලදී සැමියාට ඇයගේ මාපියන්ගේ නිවසෙහි නතරවීම සඳහා පොරොන්දු පිට කෙරුණු විවාහයයි. සීගිරි ගී සමුච්චයෙහි 154 වන කවිය ලියන මහසත්ත නමැත්තා තමා හඳුන්වාදීම සඳහා යොදාගත් පාඨයෙන් මෙකී අනුමානයට හේතු සැපයී ඇත. 'මහ අමුණ්දොරැ වසන බොයකල සැමි මහසත්තයමි' ඔහු තම අනන්‍යතාව දක්වා ඇත. එනම්, මහඅමුණ්දොර නමැති තැන වසන බොය නමැති කාන්තාවගේ සැමියා වූ මහාසත්ත නමැත්තා වෙමි යනුයි. සාමාන්‍යයෙන් සීගිරි කාන්තාවන් බහුතරයක් සිය අනන්‍යතාව දක්වා ඇත්තේ සැමියාගේ නම දක්වමින් 'භාර්යා' යන භූමිකාව පෙරදැරි කොටගෙනය. එහෙත් උක්ත හැඳින්වීම ඊට වඩා වෙනස් වේ. ඒ අනුව එය බින්න විවාහයක් හෝ බොය නමැති කාන්තාව වඩාත් ප්‍රකට තැනැත්තියක් වූ නිසා එනම දැක්වූවා විය හැකිය. එමෙන්ම 286 වැනි ගීයෙන් දැක්වෙන 'සා තා කලු ගෙ වසන වජුර් අග්බොය්මි' හැඳින්වීමද බින්න විවාහය ගැන යම් ඉඟියක් දක්වයි. වජුර් අග්බෝ පවසා ඇත්තේ තමා සාතා කලුගේ නිවසෙහි වසන බවයි (මුණසිංහ, 2011:122). එනමුදු එස්. බී. හෙට්ටිආරච්චි මේ මත දෙකම ප්‍රතික්ෂේප කර ඇත. ඒ මෙසේය. ''වජුර් සාතාගේ සැමියාද, නොඑසේනම් ඇගේ නිවසේ වාසය කළ ඥාතියෙකු හෝ වෙනත් තැනැත්තෙක්ද යන්න පැහැදිලි නැත... මහසත්තයි තම බිරිඳගේ නිවසේ වාසය කළ කළ බව සඳහන් වන්නේත් නැත. එම සඳහනේ මහඅමුණුදොර ඔහු විසූ තැන හැටියට සඳහන් වන නමුත් එය තම බිරිඳගේ නිවස බව සඳහන් නොවේ.'' මෙහි සිදුව ඇත්තේ මහසත්තයි තම බිරිඳගේ නම සඳහන් කිරීම පමණක් බව ඔහුගේ අදහසය (හෙට්ටිආරච්චි 2008:91). කෙසේවුවද මින් පැහැදිලි වනුයේ බොය හා සාතා කලු යන කාන්තාවන් දෙදෙනාම එකල කිසියම් සමාජ තත්ත්වයක් හිමිකරගෙන සිටි බවකි. එකී සමාජ තත්ත්වය හේතුවෙන් මහාසත්ත හා අග්බොයිට තම අනන්‍යතාව දැක්වීමේදී එම කාන්තාවන් දෙදෙනා නොසලකා හැරීමට නොහැකි වී ඇති බවයි.

තවද සිය ස්වාමිපුරුෂයාගේ නාමය දක්වා ඔහුගේ භාර්යාව ලෙස සිය අනන්‍යතාව ප්‍රකාශ කළ කාන්තාවෝද වූහ. කිතග්බො හිමි අම්බු තිසා, උතුරා අබු සිව්කල සහ මහමෙත් හිමියා අබු නාල් ඔවුන්ගෙන් කීපදෙනෙකි (මුණසිංහ,2011:97). ඒ සියල්ලෝම සිය භූමිකානුප්‍රකාරව සමාජය ඉදිරියේ පෙනී සිටියෝ වූහ. ඒ අතර වූ මත්වග සමන වූකලි සගල් නම් රජිනගේ වංශයෙහි වූ පසිලි නමැත්තාගේ භාර්යාවකි. රජිනකගේ වංශය පවා පුරුෂයාගේ අනන්‍යතාව දැක්වීමේදී පිළිගැනීමට ලක්ව ඇති බව ඉන් පැහැදිලි වේ.

පහත දැක්වෙන්නේ නිදලු මිහිදබු සෙවු එනම්, නිදලු මිහිඳ් නමැත්තාගේ භාර්යාව වූ සෙවු රචනා කළ කවියයි.

*මහනෙල බර වරල ගෙල හුණ පිහිරල රසන්*
*ඇඳිනි තමා මෙ බැලුම සෙවනක වී අප නුයුනග තා*
*(41) (ධම්මානන්ද හිමි,1966:56-57).*
*(මහනෙලින් බර පීරාලා ගෙතූ වරලස ගෙලට වැටුණා වූ තොපගේ නෙත් කෙළවරින් දෙන මේ බැල්ම සපත්නියකගේ වන්නේ යැයි අප විසින් හඳුනා ගන්නා ලදි.)*

සෙවුගේ නිරීක්ෂණයට ලක්වන්නේ කාන්තාවගේ නෙත් කොන් බැල්මකි. ඒ හේතුවෙන් ඇය සපත්නියක ලෙස හඳුන්වන්නට සෙවු පෙලඹී ඇත. සපත්නිය යනු සමාන භාර්යාවයි. එකම ස්වාමියාගේ භාර්යාවන්ය. එක් පුරුෂයකුට භාර්යාවන් කිහිප දෙනෙකු සිටින විට ඒ සියලු භාර්යාවෝ සපත්නිහු වූහ. සමාන භාර්යාවරු ඔවුනොවුන්ට සතුරු වෙති (ධම්මානන්ද හිමි,1966:57). ස්වාමියා කෙරෙහි ආදර ගෞරවයෙන් යුතු භාර්යාවන් සේ පැවතීම ඉන් අපේක්ෂා කළද කාන්තාවන් අතර වන තරගකාරී බව, ඊර්ෂ්‍යා පරවශ බව සපත්නීන් එකිනෙකාගෙන් දුරස් කිරීමට හේතු වී ඇත. සෙවු සිය කවියෙන් විස්තර කළ කාන්තාවගේ බැල්ම හේතුවෙන් සපත්නියක ලෙස ඇයව දක්වනුයේ අත් දැකීමෙන් එබඳු බැලුම් විඳ ඇති නිසා බව පැහැදිලිය. සෙවු භාර්යාවකගේ භූමිකාව නියෝජනය කරමින් සිය සමාජ තත්ත්වයට අනුව නිසි ලෙස පැවැතුණද ඇය කෙරෙහි වන සාමාන්‍ය ගති ස්වභාවය මෙහිදී ඉස්මතු වී ඇති බව පෙනේ. එනම් ඇයද සපත්නියකගේ භූමිකාව නිරූපණය කරන බවයි.

මෙලෙසින්ම සපත්නියක ගැන කියැවෙන තවත් කවියක් සීගිරි කුරුටු ගී අතර වේ. එය ලියන්නියද කාන්තාවකි. මහමත අම්බු දෙවා ලෙස තමාව හඳුන්වාදෙන ඇය වනාහි මහාමාත්‍යවරයාගේ භාර්යාව වූ දේවාය.

*මනමෙසි නැගි බෙයන්දහි ලෙ(ණා)සි යොවනක් මය් අතින් මුතුවැළැ ගත බැලුමැ අප හය සෙපත අව (හ)ය ගත (152) (ධම්මානන්ද හිමි,1966:176)*
*(බෙයදෙහි සිටින මියුලැසි යෞවනියක් මගේ සිතෙහි අමර්ෂය ඉපිද වූවාය. අතින් මුතුවැළක් ගත් ඇගේ බැල්ම හේතුකොටගෙන ඕ අපගේ සපත්නියක බඳු වූවාය.)*

යට දැක්වූ කවියෙන් පැවසෙන පරිදි මහාමාත්‍යවරයාගේ භාර්යාවටද අතින් මුතුවැළක් ගත් යෞවනිය සපත්නියක ලෙස දැනෙන්නේ ඇගේ බැල්ම නිසාය. කාන්තාවන්ගේ බැල්ම තවත් කාන්තාවන් හඳුනාගන්නා ආකාරයත් එකී බැල්ම හේතුවෙන් ඔවුන්ගේ භූමිකාව නාම ගැන්වීමත් යට දැක්වූ කවි දෙකෙන්ම සිදු වී ඇත. නිදලුගේ භාර්යාව වූ සෙවුගේ කවියෙන් ඇගේ සිතෙහි සපත්නිය වූ කාන්තාව කෙරෙහි අහිතක් ඇති බව විද්‍යමාන නොවේ. එහෙත් මහාමාත්‍ය භාර්යාවගේ සිතෙහි ඇය දුටු යෞවනිය කෙරෙහි ඇත්තේ අමර්ෂයකි. තරහවකි. මේ වනාහි සපත්නීරෝෂයයි. සපත්නිය තුළ ඇතිවන කෝපයයි (සෝරත හිමි, 1999:1032). '' මේ යොවුන් ළඳ අතින් මුතුවැළක් ගෙන සිටී. අද දක්නට තිබෙන සීගිරි චිත්‍ර අතර මුතුවැළක් රැගත් කාන්තා රූප නැත්තා සේම අභාවයට ගිය චිත්‍ර අතරද එබඳු රුවක් තිබුණහයි සිතිය නොහැකිය. මන්ද ඔවුන් මල් අතින් ගෙන, මල්පළුවලින්ම සැරසී සිටින හෙයිනි. මේ ගීය විමසීමෙහිදී සහෘදයාගේ අවධානය විශේෂයෙන් යොමු විය යුතු පදයක් ඇත. ඒ 'බැලුමැ' යන්නයි. මහමතගේ බිරියට මේ යොවුන් ළඳ සපත්නියක සේ පෙනුණේ ඇගේ බැලුම හේතුකොටගෙනයි. තම සැමියා දෙස යොවුන් ළඳ හොරැහින් බලනු දුටු කිවිවරියට එවන් ඉරිසියාවක් හටගන්නට ඇත'' (ඩයස්, 1994:21). සපත්නීරෝෂය හටගන්නේ භූමිකා සට්ටනයෙනි. තත්ත්වයන් දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයකට අදාළ කාර්ය කොටස් එකිනෙකට ප්‍රතිවිරුද්ධ අයුරින් බලපෑමේ ප්‍රතිඵලයක් ලෙස භූමිකා සට්ටනය උද්ගත වේ. භූමිකා අතර ගැටුමක් ඇති වන අවස්ථාවකදී සියලු පාර්ශ්ව තුලනය වන පරිදි සමාජ අපේක්ෂා කුළුගැන්වෙන ආකාරයෙන් ක්‍රියා කිරීමට නොහැකි වේ (ජයසිංහ,2013:124-135). උක්ත කාන්තාවන්ට මුහුණ පෑමට සිදුවී ඇත්තේ බහුභාර්යා විවාහ සහිත සමාජයක භාර්යාව, පෙම්වතිය හා සමාන භාර්යාවන් අතර සහෝදරියක ලෙස පැවතීම යන භූමිකාවල සට්ටනයටයි. මේ හේතුවෙන් මානසික පීඩනය, ඊර්ෂ්‍යාව, කෝපය වැනි හැඟීම් ඇතිවීමත් සිදුවේ. යට දැක්වූ කවිවලින් විද්‍යමාන වන්නේ එකී තත්ත්වයි. සෙවු මෙන්ම දේවාද භාර්යාවෝය. ඔවුහු තම අනන්‍යතාව භාර්යා ලෙස දැක්වූවා පමණක් නොව භාර්යාවන්ගේ භූමිකා රංගනයේදී එකල සමාජයේ අත්විඳීමට සිදුවූ දුෂ්කර අවස්ථාවක්ද සිය කවියෙන් හෙළිදරව් කළෝය.

භාර්යාවගේ භූමිකාව සැමියාගේ අසංතෘප්තියට ලක්වී ඇති අයුරු විශද කෙරෙන අදහසක් මිහිදල ඇපාණන් රචනා කර තිබේ.

*පුරුජුගුණ සි(ත) නොගත අදහයි ඇබි සෙයි*
*බෙයන්දිහි රන්වන් ඇති මන ග(න්නි) ම(නා වෙ) සෙන් (ධම්මානන්ද හිමි,1966:71)*

මෙම කවියට දො. ඩ. ඩයස් සපයන අර්ථ විවරණය මෙබඳුය. ''අඹුවගේ මෙන් පුරුදු ගුණ ඇති ඈ අදහාගත නොහැකිය. සිත නොගත්තාය. (එහෙත්) බෙයදෙහි මනා වෙසින් සිටින රන්වන් ලිය සිත ගනියි... සීගිරියට පැමිණ සිටි කවියා දුටු කාන්තාව පුරුදු ගුණ ඇති ඔහුගේ බිරිය වැනිය. ඈ අදහාගත නොහැකිය. විශේෂ අමුත්තක් හෝ අරුමයක් දැකගත නොහැකි හොඳින් දන්නා අඳුනන ඔහුගේ බිරිය වගේමයි, ඔහුට දැකගන්නට ලැබුණු මේ කාන්තාව. ඒ නිසා ඇය අත්හැර දමන කවියා මනා වේශයකින් සිටිනා අපූර්වත්වයක් දැකිය හැකි රන්වන් සීගිරි ළඳ සිත් ඇදගන්නා බව කියයි'' (ඩයස්, 1994:5-6).

මෙහිදී කවියාට සීගිරියේදී හමුවූ කාන්තාවක් අරුචි වන්නේ, සිත නොගන්නේ ඇය ඔහුගේ බිරිඳ වැනි වූ නිසාය. මේ කාන්තාවද කිසිදු අමුත්තක් නැති ඔහුගේ භාර්යාව වැනිය. විවාහක සහකරු හෝ සහකාරිය අඹුසැමියන් ලෙස අන්තර් සබඳතා ආරම්භ කිරීමෙන් අනතුරුව තමන් විසින් විවාහයට පෙර නිගමනය කර තිබූ ආකාරයේ ඇතැම් චර්යා විවාහ සන්ධානයට නොගැළපෙන බව තේරුම් ගැනීම අවශ්‍යය. එහිදී එවන් චර්යා වෙනස් කර නොගතහොත් අඹුසැමියන් අතුරින් කෙනෙකු හෝ දෙදෙනාම සිය භූමිකාවට අදාළ කාර්ය කොටස් ඉටු කිරීමට යාමේදී අසංතුෂ්ටියට පත් වේ. නැතහොත් මානසික පීඩනයට පත් වේ. මෙකී අසංතෘප්තිය දිගින් දිගටම වර්ධනය වීමෙන් දෙදෙනා අතර වන නොගැළපීම් වැඩිවේ. එනම් ස්වාමිභාර්යා භූමිකා නම්‍යශීලි බවින් ඈත්වීමයි (ජයසිංහ, 2013:110). ඉහත දැක්වූ කවිය

වූකලි එසේ නම්‍යශීලී භූමිකාවෙන් තොරවූ විවාහ සංස්ථාවක ඛේදය ගැන කෙරෙන සැමියකුගේ ආත්ම ප්‍රකාශනයකි. තමන් සෑම මොහොතකම දැක පුරුදු චර්යා රටාවෙන් හෙබි භාර්යාව ඔහුගෙන් ප්‍රතික්ෂේප වී ඇති ආකාරය මෙකී කවියෙන් විද්‍යමාන වේ.

හුණගිරි වෙහෙරින් පැමිණි තෙරණිය ලියූ ගීයෙන් ඉස්මතු වී පෙනෙන්නේද භූමිකා සට්ටනයක ස්වරූපයයි.

*වෙසෙයි ජන එ කී සවණිහි රකනෙය සිහිල*
*මන මය බියි කැරැ හැ පුළහසු විජනින තතනුය (88)*
*(ධම්මානන්ද හිමි, 1966:106)*

මේ ගීයට ආනන්ද තිස්ස කුමාර දක්වන අර්ථය මෙසේය. 'පුළුල් සිනහව විහිදෙත්ම තැති ගැනේ. මගේ සිත බියපත් කරයි. ඒ කියූ තැනැත්තා ළඟම වෙසෙයි. සිහිය කනෙහිලා රකුව. (ඒ බියකරු සිනාහඬ එදැයි කල්පනාකාරීව ඉන්න)(තිස්ස කුමාර, 2003:23). මේ තෙරණියද මුහුණ පා ඇත්තේ මානසික සට්ටනයකටයි. පුද්ගලයන් විසින් හොබවනු ලබන තත්ත්වයට අදාළ භූමිකාවන් හා සම්බන්ධ වගකීම්, සමාජ අපේක්ෂා ඉටු කළ නොහැකි වීමේ ප්‍රතිඵලයක් ලෙස භූමිකා වික්‍රියාවන් ඇති විය හැකිය (ජයසිංහ, 2013:137-138). තෙරණිය මෙහිදී සිත සමාධිගත කරගැනීමට උත්සුක වන්නේ එකී භූමිකා වික්‍රියාවක් සිදුවීම වැළැක්වීමටයි. තෙරණියක වුවද ඇයද කාන්තාවකි. එහෙත් තෙරණියක ලෙස සමාජයෙන් අපේක්ෂිත භූමිකා රංගනයේ යෙදීමේ අභියෝගයට උන්වහන්සේ මුහුණ පා ඇති බව පෙනේ. සිහියෙන් සිටිනා ලෙසට උන්වහන්සේ තමන්ටම අවධාරණය කරගන්නේ එබැවිනි.

එසේම වඩාත් කෙළිලොල්, ක්‍රියාශීලි කාන්තාවෝ පිරිමින්ගේ අවධානය දිනාගත්හ. එනමුදු ඔවුන්ගේ එකී චර්යා රටා පුරුෂයන්ගේ විවේචනයට ලක්විය. කුමර කසබා ලියූ ගීයෙන් කියවෙන්නේ එබඳු කාන්තාවක් ගැනය. (238 කවිය) ඇය 'පාජ' නමැති ක්‍රීඩාව කරන නියායෙන් එහි සිටි සියලු පිරිමින් ස්පර්ශ කිරීම ඔහුගේ දෝෂ දර්ශනයට හේතුවිය (ඩයස්, 1994:42). පුරුෂ මූලික සමාජයේ කාන්තාව සම්බන්ධයෙන් ගොඩ නැගුණු භූමිකා අපේක්ෂාව උක්ත කවියේ කාන්තාවගේ චර්යා රටාව හේතුවෙන් ඛණ්ඩනය වීම කුමර කසබාගේ අකැමැත්තට හේතු වී ඇත. මතු දැක්වෙන කවියෙන් කියවෙනුයේද භූමිකා අපේක්ෂාව හේතුවෙන් අසරණ වූ කාන්තාවක් ගැනයි.

*මහනෙල් ගත් ක(තු)න් (දා)කුත් (මා) දග් කොට තිබී*
*බියෙන් මෙන් බිණිය නොහෙයි බැලූ හිමියා සි(ටි)ය මෙන් (199) (ධම්මානන්ද හිමි,1966:221)*

මේ කවියාගේ අදහස වී ඇත්තේ මහනෙල් මල් අතින් ගත් කාන්තාවන් මේ කවියාව සිර කොට තබා ඇති බවයි. එනමුදු එතැනදී දුටු එක් කාන්තාවකට මේ කවියා සමඟ කතා කිරීමට අවශ්‍යව ඇත. එහෙත් ඇගේ සැමියා ඒ බව දකිවී'යි ඈ බියට පත්ව පරීක්ෂාවෙන් වටපිට බලා ඇත. මින් ගම්‍යමාන වන්නේ තමා රිසි කෙනෙකු හා කතාබහ කිරීමේ අවකාශය මේ කාන්තාවට අහිමි වී ඇති බවය. පතිනියක ලෙස ඇයගෙන් අපේක්ෂිත භූමිකා රංගනය තීරණය වී ඇත්තේ ඇය නියෝජනය කරන සංස්කෘතියට සාපේක්ෂවය. ''සෑම සමාජ අවස්ථාවකටම සහභාගී වන පුද්ගලයන් අතර අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකාගේ හැසිරීම කවරාකාරයට සකස් විය යුතුද යන්න පිළිබඳව භූමිකා අපේක්ෂාවක් පවතී. යම් යම් සමාජ තත්ත්වයනට අදාළ නිරවද්‍ය හෝ ශිෂ්ට යැයි සම්මත හැසිරීමට සාපේක්ෂව මෙකී අපේක්ෂාවන් ගොඩ නැගෙනු දක්නට ලැබේ. මේ අනුව කෙනෙකුගේ සමාජ හැසිරීම කිසියම් දුරකට සමාජීය භූමිකාව මගින් ප්‍රමිත කරනු ලැබූවක් බවද පෙනී යයි'' (ජයසිංහ, 2013:124-125). යට දැක්වූ කවියෙන් කියවුණු කාන්තාව අපහසුතාවට ලක්වී ඇත්තේ සමාජයෙන් නිර්දේශිත හැසිරීමෙහි අපේක්ෂාව සියතින් ඛණ්ඩනය වේ යැ'යි යන බිය නිසාය. ඒ වනාහි සමාජයට ඇති බියට වඩා පවුල් සංස්ථාව අරභයා ඇති වූවකි. ඇය සැමියාට රහසේ එකී අපේක්ෂාව ඛණ්ඩනය කිරීමේ අවකාශයක් සොයාගන්නේ එබැවිනි.

සීගිරි සමාජයේ ස්තරායනය ප්‍රකට කරන කවියක් වැලිගම් වැසියකු වූ අග්බෝ ලියා ඇත.

*පිළ අපුලන තොට් නැත්තෙන් හළුගර් නැත්තෙන්*
*වැ(ද) වෙසෙය් රිදියක් බෙයන්දිහි රන්වනුන් අතුරෙ (410)*
*රෙදි අපුල්ලන්නට තොටක් නැති නිසාද අළුබඳුන් තබන ගෙයක් (වෙල්ලා හැලියක්) නැති නිසාද රජක ස්ත්‍රියක් බෙයදෙහි රන්වන් ලියන් අතර වැද වෙසෙයි (ඩයස්,1994:72).*

කවියාගේ නිරීක්ෂණයට ලක් වී ඇත්තේ එවක සමාජයේ කුල ධුරාවලිය අනුව පහළ පාන්තික තත්ත්වයක් නියෝජනය කරන කුලයක කාන්තාවක් සීගිරි නරඹන්නන් අතර වූ බවයි. මේ රජක ස්ත්‍රියද පැමිණ ඇත්තේ සීගිරිය හා එහි සිතුවම් නැරඹීමටයි. මෙතැනදී ඇයගේ භූමිකාව ඇගේ ජීවන වෘත්තිය නොවේ. එහෙත් එවක සමාජයේ සමාජ තත්ත්වය,

ජීවන වෘත්තිය හා අන්‍යෝන්‍ය වශයෙන් බැඳී පවතී. එනම්, සමාජ භූමිකාව හා අනුයුක්ත වූ තත්ත්වයයි. උක්ත කාන්තාව කොතැනක කුමන අවස්ථාවක් නියෝජනය කළද ඇගේ සමාජ තත්ත්වය බැඳී ඇත්තේ ඇගේ භූමිකාව සමඟ බව මෙම කවියෙන් පැහැදිලි වේ. මෙබඳු පාන්තික තත්ත්ව නියෝජනය කළ පිරිමින්ද අඩුවැඩි වශයෙන් සීගිරි නරඹන්නන් අතර සිටින්නට ඇත. එහෙත් ඍජුවම එම තත්ත්වය පැහැදිලි කර ඇත්තේ කාන්තාවක් කේන්ද්‍ර කරගනිමිනි. ඒ අනුවද තත් සමාජානුප්‍රකාරව භූමිකා නිරූපණයේදී කාන්තාව අත්විඳි ජීවිත අභියෝගය පැහැදිලි වේ.

**සමාලෝචනය**

සීගිරි කවි වූකලි ස්වාධීන පද්‍ය රචනා සමුච්චයකි. කිසිදු ගුරුකුලයකට, නියමයකට, ආරාධනාවකට, පරමාර්ථයකට, කාව්‍ය ආකෘතියකට අනුගත නොවී සීගිරිය නැරඹීමට මෙරට විවිධ දිශාවලින් පැමිණි ජනයා විසින් ලියූ කාව්‍යාවලියකි. ආනන්ද තිස්ස කුමාර පවසන පරිදි පළමු ස්ත්‍රී සාහිත්‍ය කෘතිය සීගිරි ගීය. සීගිරිය නැරඹීමට පැමිණි විවිධාකාර ජන සමාජීය පුද්ගලයන් තම සිතැඟි පමණක් සටහන් කිරීමට පෙලඹී ඇත්තේ කාව්‍ය නිර්මාණය පිළිබඳව පැවැති අසීමිත නිදහස හේතුවෙන් බවත් කාන්තාවන්ට ස්වකීය අභිමතය අනුව අදහස් ප්‍රකාශ කිරීමට අවකාශය සීගිරි කැටපත් පවුරෙන් හිමි වූ බවත් ඔහුගේ අදහසය. එහෙත් මෙකී අවදිය සමාජයේ දැඩි ගතානුගතික ස්වරූපයක් බල පැවැත් වූ කාලයක් බවද ආනන්ද තිස්ස කුමාර පවසා ඇත (තිස්ස කුමාර, 2003:15-21). එබඳු සමාජයක සංස්කෘතික සම්ප්‍රදාය, සිරිත් විරිත් ආදිය සීගිරි කවියෙන් නිරූපිත කාන්තාවන්ගේ සමාජීය භූමිකා හැඩ ගස්වා ඇති බව පෙනේ. සීගිරි කවියේ බල ගතිකත්වය කක්ෂගත වී ඇත්තේ සාම්ප්‍රදායික ස්ත්‍රී-පුරුෂ භූමිකා සහ සමාජ අපේක්ෂා ඇසුරෙහිය. මෙකී සාකච්ඡාවට පාදක කරගත් කාව්‍යාවලියෙන් නිරූපණය වී ඇත්තේද තත් සමාජයේ ස්ථාපිත භූමිකා හා සමාජීය අපේක්ෂායි. භාර්යාවක් සපත්නියක වීමෙන් මතුවන භූමිකා ඝට්ටනය මෙහිලා ඉස්මතු වන්නේ එබැවිනි. එය ඉහළ ස්තරය නියෝජනය කරන මහාමාත්‍ය භාර්යාවටද සාමාන්‍ය ගැහැනියටද වෙනසක් වී නැත. එසේම සාම්ප්‍රදායික භාර්යා භූමිකා නිරූපණයේ අසාර්ථකත්වය හේතුවෙන් වෛවාහික සංස්ථාවේදී කාන්තාව ප්‍රතික්ෂේපයට පත්වීමෙන් ප්‍රකට වන්නේද සමාජීය අපේක්ෂා බණ්ඩනය වීමකි. මෙහිදී වඩාත් පීඩනයට, අසාධාරණයට හා අවප්‍රමාණයට පත්වන්නේ කාන්තාවයි. පොදු සමාජ අපේක්ෂා වඩාත් සක්‍රීයව බල පැවැත්වෙන්නේ පුරුෂයාට වඩා කාන්තාව කෙරෙහි වීම මෙහිදී ප්‍රකට වූ අනෙක් යථාර්ථයයි. සීගිරි සමාජයේ කාන්තාව කුමන තරාතිරමක, තත්ත්වයක සිටියද භූමිකා න්‍යාය ක්‍රියාත්මක වී ඇත්තේ අනම්‍ය ස්වරූපයකිනි. ඇය තෙරණියක, සාමාන්‍ය ගැහැනියක, ප්‍රභූ කාන්තාවක හෝ පහත් කුල කාන්තාවක වුවද සමාජීය අපේක්ෂා අර්ථකථනය වී ඇත්තේ සාම්ප්‍රදායික දෘෂ්ටිකෝණයෙනි. විරුද්ධ ලිංගික ආකර්ෂණය හා පුරුෂ සමාගමය සඳහා පැන වී ඇති සමාජීය තහංචි මෙන්ම ස්ව කැමැත්තෙන් පනවා ගත් සීමාවලින්ද ප්‍රකට වන්නේ එවක සමාජයේ බල පැවැත්වුණු සාම්ප්‍රදායික සමාජ සම්මතයයි. සැමියාට රහසින් අන් පුරුෂයකු හා කතා කිරීමට රුචි වූ ස්ත්‍රියත්, ස්වකීය සතිය පිහිටුවා ගැනීමට උත්සාහ දරන තෙරණියත් තුළින් පැහැදිලි වන්නේ එයට එරෙහි වීම සඳහා ඔවුන් දරන උත්සාහය හා එහි පරස්පරතාවයි. වෛවාහික, කුල, ආගමික සංස්ථා ආදී සියලුම සමාජීය සංස්ථා කාන්තාවගෙන් අභිප්‍රේත වූ භූමිකා රංගනය හා සමාජීය අපේක්ෂාවලින් සිදු වී ඇත්තේ ආභ්‍යන්තරිකව මෙන්ම බාහිරව ස්ත්‍රිය පීඩාවට පත්වීමකි. ඒ පිරිමි ඇසින් සහ ඔවුන්ගේ ගතානුගතික අර්ථ දැක්වීම්වලින් මිදෙන්නට කාන්තාවට අපහසු වන බැවිනි. කෙසේ වුවද සීගිරි ගී ස්වාධීන කාව්‍යාවලියක් වූ හෙයින් එකී සැඟවුණු යථාර්ථය මනාව අනාවරණය වී ඇති අතර පොදු සමාජයේ මතවාදයද ඉන් ධ්වනිත වී තිබෙනු දැකිය හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


අභයසුන්දර, ප්‍රණීත්. (2001). අග්බෝ දා දොළොස් මහ කවියෝ, කොළඹ:ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ජයසිංහ, ඒ.කේ.ජී., (2013). සමාජවිද්‍යාව මූලික සංකල්ප 2, කඩවත:කඩුල්ල ප්‍රකාශන.

ඩයස්, දො. ඩ., (1994). දිවමන් ලඳුනට ගැයූ සීගිරි ගී, කොළඹ: මධ්‍යම සංස්කෘතික අරමුදල.

තිස්ස කුමාර, ආනන්ද. (2003). සිංහල සාහිත්‍යයට ස්ත්‍රී දායකත්වය, කොළඹ: ග්ලෝබ් ප්‍රින්ටින් වර්ක්ස්.

මුණසිංහ, ඉන්ද්‍රාණි. (2011). පැරණි ලක්දිව කාන්තාව, කර්තෘ ප්‍රකාශනයකි.

ලොකු බණ්ඩාර, වි.ජ.මු., (2009). සීගිරි ගී සිරි, කොළඹ:අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

හෙට්ටිආරච්චි, ඇස්. බී., (2008). ලංකාවේ සමාජ හා සංස්කෘතික ඉතිහාසය, කර්තෘ ප්‍රකාශනයකි.

සම්භාව්‍ය සිංහල පද්‍යකාව්‍ය උද්ධෘත, (2005). නාරද හිමි, කිවුලේගෙදර. (සංස්.), හෝමාගම: සුමග.

සීගිරි පද්‍ය, (1966). ධම්මානන්ද හිමි, තලල්ලේ. (සංස්.), කොළඹ: අනුල මුද්‍රණාලය.

සෝරත හිමි, වැලිවිටියේ. (1999). ශ්‍රී සුමංගල ශබ්දකෝෂය, කොළඹ:ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

Turner, Ralph H., (2006), “Role Theory”, Handbook of Sociological Theory, Jonathan H. Turner (Ed.), New York: Springer.